# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2003 අංක 42 දරන ශ්‍රී ලංකා උපදේශක ඉංජිනේරු සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 2003 දෙසැම්බර් මස 15 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2003 දෙසැම්බර් මස 19 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ **ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 8.25 යි. තැපැල් ගාස්තුව : රු. 4.50 යි.

## 2003 අංක 42 දරන ශ්‍රී ලංකා උපදේශක ඉංජිනේරු සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2003 දෙසැම්බර් මස 15 වන දින]

එල්. ඩී.–ඕ. 49/2002

### ශ්‍රී ලංකා උපදේශක ඉංජිනේරු සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව.

“ශ්‍රී ලංකා ඉංජිනේරු උපදේශකයන්ගේ සංගමය” යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංගමයක් උපදේශක ඉංජිනේරු වෘත්තියේ පොදු වැඩි දියුණුව සඳහා හා එකී සංගමයේ සාමාජිකයන් එකඟ වූ ව්‍යවස්ථාවලට අනුව එකී සංගමයට සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද :

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද, ඒ පරමාර්ථ හා කාරණා එකී සංගමය විසින් මෙතෙක් කල් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටුකරගෙන ගොස් ඇති හෙයින් ද එකී සංගමය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද එසේ සංස්ථාගත කිරීම මහජන යහපතට හේතු වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

ලුහුඬු නාමය.

1. මේ පනත 2003 අංක 42 දරන ශ්‍රී ලංකා උපදේශක ඉංජිනේරු සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ශ්‍රී ලංකා උපදේශක ඉංජිනේරු සංගමය සංස්ථාගත කිරීම.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට හා ඉන් පසු (මෙහි මින් මතු “සංගමය” යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා උපදේශක ඉංජිනේරු සංගමයේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කර ගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු “සංස්ථාව” යනුවෙන් සඳහන් කරනු ලබන) යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් ද ඒ සංස්ථාව විසින් ද ඊට විරුද්ධව ද සියලු අධිකරණවල නඩු

පවරනු ලැබිය හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඊට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව පිහිටුවීමට හේතු වූ පොදු පරමාර්ථ පහත දැක්වෙන ඒවා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :–

(අ) උපදේශක ඉංජිනේරුවරයන්ගේ වෘත්තිය පෝෂණය කර ප්‍රවර්ධනය කිරීම ;

(ආ) උපදේශක ඉංජිනේරුවරයන්ගේ වෘත්තියමය අයිතීන්, අයිතිවාසිකම්, බලපෑල හා වරප්‍රසාද ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම ;

(ඇ) ඉංජිනේරු වෘත්තිය සම්බන්ධව කෙලින්ම හෝ අන්‍යාකාරයෙන් බලපාන කරුණු නිරාකරණය කර ගැනීමට අවශ්‍ය ඉංජිනේරු උපදේශක මතය සහ පහසුකම් ආණ්ඩුවට, ආණ්ඩුවේ නියෝජ්‍යායතනවලට සහ අනිකුත් අයට සැපයීම ;

(ඈ) ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් සංවර්ධනය සහ වෙනත් ඉංජිනේරු ව්‍යාපෘති සඳහා උපදේශක සේවා සැලසීමේ කාර්යය සඳහා සාමාජිකයන් අතර හවුල් ව්‍යවසායන් සඳහා පහසුකම් සැලැස්වීම සහ එම ව්‍යාපෘති සඳහා දායක වන්නන්ගෙන් මූල්‍යමය ආධාර ලබාගැනීම ;

(ඉ) පොදු වශයෙන් වැදගත් වන කාරණා පිළිබඳව නිෂ්පාදකයන්, කොන්ත්‍රාත්කරුවන් හා ඉංජිනේරු කර්මාන්තවල නිරත පුද්ගලයන් නියෝජනය වන සංගම් හා සංවිධාන සමග සාකච්ඡා පැවැත්වීම ;

(ඊ) උපදේශක ඉංජිනේරුවන්ගේ පොදු වෘත්තිය ක්‍රියාකලාපය හා චර්යා පිළිබඳ ප්‍රමිති හඳුන්වා දීම සහ ඔවුන්ගේ වෘත්තිය කටයුතුවල දී එම ප්‍රමිති පවත්වා ගැනීම ;

(උ) ශ්‍රී ලංකාව තුළ උපදේශක ඉංජිනේරුවන්ගේ ගාස්තු පරිමා හා ඔවුන්ගේ සේවය ලබා ගැනීමට අදාළ කොන්දේසි තීරණය කිරීම ;

(ඌ) සංස්ථාවේ පරමාර්ථ සියල්ල හෝ ඉන් කිසිවක් ප්‍රවර්ධනය කිරීමේ සහ වෘත්තිය ආයතනයකට නිසි අයිතිවාසිකම්, වරප්‍රසාද සහ සහන ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව ආණ්ඩුව සමග හෝ එහි යම් පාලිත ආයතන සමග ගිවිසුම්වලට එළඹීම;

(එ) වෙනත් රටවල උපදේශක ඉංජිනේරු සංගම් සමග සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාම සහ ජාත්‍යන්තර උපදේශක ඉංජිනේරු සංවිධාන සමග අනුබද්ධව කටයුතු කිරීම ;

(ඒ) සංස්ථාවේ සියලු පරමාර්ථ හෝ ඉන් කිසිවක් හෝ සාක්ෂාත් කර ගැනීම පිණිස අවශ්‍ය විය හැකි වෙනත් යම් ක්‍රියාමාර්ග ගැනීම.

4. මේ පනතේ සහ වෙනත් කවර හෝ ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව පහත සඳහන් කටයුතු සඳහා එනම්, – සංස්ථාවේ බලතල.

(අ) අරමුදල් රැස්කිරීම සහ මුදලින් හෝ ද්‍රව්‍යමය වශයෙන් හෝ ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග භාරගැනීම හා දායක මුදල් ඉල්ලා ලබා ගැනීම ;

(ආ) චංචල හෝ නිශ්චල දේපළ කවර හෝ ආකාරයකින් අත්කර ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම සහ සංස්ථාවේ කටයුතු සඳහා අවශ්‍ය හෝ පහසුවක් වන යම් ගොඩනැගිලි හෝ නිර්මාණ ඉදිකිරීම, නඩත්තු කිරීම සහ ඒවායේ වෙනස්කම් කිරීම ;

(ඇ) බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාම සහ වැසීම හා ඇප ඇතිව හෝ නොමැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම ;

(ඈ) සංස්ථාවේ කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන මුදල් 5 වන වගන්තිය යටතේ යථාපරිදි තෝරා පත් කර ගනු ලැබූ පාලක සභාව විසින් සුදුසු යයි සලකනු ලබන ආකාරයකින් ආයෝජනය කිරීම ;

(ඉ) යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් සමග ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්තුවලට ඇතුළත් වීම ;

(ඊ) සංස්ථාව විසින් සපයනු ලබන සේවා සඳහා ගාස්තු අයකිරීම ;

(ඇ) සංස්ථාවේ සාමාජිකයකුව සිටි තැනැත්තකු නැවත ඇතුළත් කර ගැනීම සඳහා සංස්ථාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වූ ගාස්තු අයකිරීම ;

(ඈ) සංස්ථාවේ නිලධරයන් හා සේවකයන් පත් කිරීමට, සේවයෙහි නියුක්ත කිරීම, සේවයෙන් පහකිරීම හෝ සේවය අවසන් කිරීම සහ සංස්ථාව විසින් තීරණය කරනු ලබන යම් වැටුප්, දීමනා සහ පාරිතෝෂික ඔවුන්ට ගෙවීම ; සහ

(එ) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය හෝ අවස්ථානුකූල වෙනත් සියලු දේ කිරීම සඳහා,

සංස්ථාවට බලය ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය.

**5.** (1) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම, පාලනය කිරීම සහ පරිපාලනය කිරීම සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවල විධිවිධාන සලස්වා තිබෙන පරිදි හා ඒ රීතිවලට අනුකූලව තෝරා පත්කර ගනු ලබන නිලධරයන්ගෙන් හා වෙනත් තැනැත්තන්ගෙන් සමන්විත වූ (මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) පාලක සභාවක් වෙත මේ පනතේ විධිවිධානවලට සහ සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව පැවරෙන්නේ ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී සංගමයේ පාලක සභාවේ සාමාජිකයන් වශයෙන් ධුර දැරූවා වූ සාමාජිකයන් සංස්ථාවේ ප්‍රථම සභාවේ සාමාජිකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

සාමාජික නාමලේඛනය.

**6.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී සංගමයේ සාමාජිකයකු වූ සෑම තැනැත්තකුගේම සහ ඉන් පසුව සංස්ථාවේ සාමාජිකයකු වශයෙන් යථා පරිදි ඇතුළත් කරගනු ලබන සෑම තැනැත්තකුගේම නම ඇතුළත් කළ යුතු සාමාජික නාමලේඛනයක් සභාව විසින් පවත්වාගෙන යා යුතු ය.

සංස්ථාවේ රීති.

**7.** (1) සංස්ථාව විසින් සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, මේ පනතට අනනුකූල නොවන රීති, පහත දැක්වෙන සියලු කාරණා සඳහා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල සෑදීම නීත්‍යනුකූල වන්නේ ය :–

(අ) සාමාජිකයන් වර්ග කිරීම, එක් එක් පන්තියට අයත් සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු, ඔවුන් ඇතුළත් කර ගැනීම, ඔවුන් ඉවත් කිරීම හෝ නෙරපීම හෝ ඔවුන්ගේ ඉල්ලා අස්වීම ;

(ආ) සභාව තෝරා පත් කර ගැනීම, සභාවේ නිලධරයන්ගේ ඉල්ලා අස්වීම, ඔවුන් ධුරයෙන් ඉවත් කිරීම හෝ ධුර අත් හැරීම සහ සභාවේ බලතල, කාර්ය සහ සභාව ක්‍රියා කළ යුතු ආකාරය ;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය හා ඔවුන් පත්කිරීම, සේවයෙන් පහකිරීම සහ ඔවුන්ගේ සේවය අවසන් කිරීම ;

(ඈ) සභාවේ, සංස්ථාවේ හෝ යම් අනුකාරක සභාවක රැස්වීම් සඳහා අවශ්‍ය ගණපූරණය හා එම රැ ස්වීම්වල කටයුතු කරගෙන යා යුතු ආකාරය ද ඇතුළුව, රැස්වීම කැඳවීම සහ පැවැත්වීම පිළිබඳ කාර්ය පරිපාටිය ;

(ඉ) සංස්ථාවේ සහ සභාවේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් සහ නුසුදුසුකම් ;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය හා කළමනාකරණය ; සහ

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය සහ සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීම.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී බලපැවැත් වූ සංගමයේ ව්‍යවස්ථා, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය යුතු අතර, එම රීති මේ වගන්තිය යටතේ රීතියක් සාදනු ලබන ආකාරයෙන් මෙන් එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ දේපළ.

8. මේ පනත යටතේ හා රීති යටතේ සංස්ථාව විසින් අත්කරගත් හෝ දරනු ලබන සියලුම චංචල, නිශ්චල දේපළ සහ සංස්ථාවට ගෙවනු ලබන හෝ සංස්ථාවට ලැබෙන සියලු මුදල් සංස්ථාවේ පරමාර්ථ ඉදිරියට ගෙනයාම සඳහා රීතිවලට අනුකූලව දැරීම, ප්‍රයෝජනයට ගැනීම හා යෙදවීම කළ යුතු ය.

ගිණුම් සහ විගණනය.

9. (1) සංස්ථාව විසින් සංස්ථාවේ ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් සහ අනෙකුත් සියලු ගණුදෙනු පිළිබඳව නිසි ගිණුම් පොත් තැබීමට සලස්වනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ගිණුම් යටත් පිරිසෙයින් වර්ෂයකට වරක් පරීක්ෂා කර විගණනය කරනු ලැබිය යුතු ය.

සංගමය විසින් සහ සංගමයට ගෙවිය යුතු ණය.

10. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයෙහි සංගමයේ පැවති සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර එදිනට සංගමයට ගෙවිය යුතු සියලු ණය, දායක මුදල් සහ ගාස්තු මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

කමිටු පත්කිරීම.

11. සංස්ථාවේ වෘත්තීය තත්ත්වය පවත්වාගෙන යාම සහ සාමාජිකයන් අතර විනය පවත්වාගැනීම උදෙසා කලින් කල යම් කමිටු පත් කිරීම සහ අවශ්‍ය අනෙකුත් කටයුතු කිරීම සඳහා සංස්ථාවට බලය ඇත්තේ ය.

සංස්ථාවේ මුද්‍රාව.

12. ලේකම්වරයා හෝ සභාව විසින් යථා පරිදි බලය දෙනු ලැබූ සභාවේ සාමාජිකයකු හා සභාවේ තවත් සාමාජිකයකු ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කවර වුව ද සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම තම අත්සන් කළ යුතු ය. තව ද එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සනකට පරිබාහිරව විය යුතු ය.

සාමාජිකයන්ගේ වගකීම සීමා කිරීම.

13. සංස්ථාවේ කිසිම සාමාජිකයකු ඔහුගෙන් සංස්ථාවට අය විය යුතු ග්‍රාහක මුදල් ප්‍රමාණය ඉක්මවන යම් මුදලක් සංස්ථාවේ ණය සහ බැරකම් නිදහස් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා ගෙවීමට යටත් නොවන්නේ ය.

14. මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් මගින්, ඔවුන්ගේ හෝ ඔවුන් යටතේ හෝ හිමිකම් පාන්නන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි අඩංගු කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

15. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.